සීමාසහිතයි

රෙජිමේන්තු මූලස්ථානය
විජයබාහු පාබල රෙජිමේන්තුව
සූර්ය ගමුණු කඳවුර
බෝයගනේ
කුරුණෑගල

රෙජි/විපාරෙ/පා/44 (   )

බෙදාහැරීම බලන්න

2025 අප්‍රේල් මස 08 දින

**මණ්ඩල පත්කිරීම - රෙජිමේන්තු මූලස්ථාන කඳවුර වටා ඉදිකර ඇති වැටෙහි අලුත්වැඩියා කටයුතු සඳහා සිමෙන්ති මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන්පත් විවෘත කිරීම**

යොමුව: රෙජි/විපාරෙ/ගතාස/ප්‍රසම්පාදන/01/2025 (48) හා 2025.04.03 ලිපිය.

1. මෙම රෙජිමේන්තු මූලස්ථාන කඳවුර වටා ඉදිකර ඇති ආරක්ෂිත වැටෙහි අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් සිමෙන්ති මල 100 ක ප්‍රමාණයක් මිලදී ගැනීම සඳහා රු. 203,500.00 ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර ලබාදී ඇති බැවින්, ඊ අනුව ආරක්ෂිත වැටෙහි අලුත්වැඩියා කටයුතු ඉටුකිරීම සඳහා වන මිලගණන් පත් ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ කැඳවනු ලබන මිලගණන් පත් විවෘත කිරීම සම්බන්ධව සොයාබලා කටයුතු කිරීමට මණ්ඩලයක් පත්කර දෙන ලෙස යොමුගත ලිපිය මගින් ඉල්ලීම් කර ඇති අතර, එම කටයුතු සිදුකිරීම සම්බන්ධව සොයාබලා කටයුතු කිරීම වෙනුවෙන් පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීගෙන්/නිලධාරීන්ගෙන් සමන්විත මණ්ඩලය මින් පත්කරනු ලැබේ.

මේජර් කේඩීඩීටී ගොතලාවල (පී/69204) - මණ්ඩල සභාපති
කපිතාන් ඩබ්ලිව්පීඩබ්ලිව් රොසයිරෝ (පී/70944) - මණ්ඩල සාමාජික
කපිතාන් ජේඑම්ආර්එස්බී කුලසේකර (පී/10680) - මණ්ඩල සාමාජික

2. උක්ත මණ්ඩලය විසින් පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

අ. මිලගණන් පත් කැඳවීම නිවැරදි ටෙන්ඩර් පටිපාටියකට අනුව සිදුවිය යුතුයි.
ආ. මිලගණන් පත් විවෘත කිරීම විනිවිදභාවයකින් යුතුව සිදුකල යුතුයි.
ඇ. මිලගණන් පත් කැඳවා ඇති ආයතන මොනවාද යන්න සොයා බැලිය යුතුයි.
ඈ. මිලදී ගැනීමට නියමිත වෙළඳ පොළ ප්‍රමුඛතා නාමය මොනවාද යන්න සොයා බැලිය යුතුයි.
ඉ. ඉපේදම වෙතින් වෙන්කර ලබාදී ඇති ප්‍රතිපාදන ඉක්මවන භාණ්ඩ හෝ සේවා සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ඉදිරිපත් කර ඇතිද යන්න සොයා බැලිය යුතු අතර, කොන්ත්‍රාත් ගිවිසුම් ලබාදී නොමැති මිල ගණන් පත් ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කල යුතුයි.
ඊ. මෙම සේවාව සිදුකිරීම සඳහා සිවිල් ආයතන වෙත සකස් කර ලබාදී ඇති මිල ගණන් පතෙහි සඳහන් කොන්දේසි වලට පටහැනිව ක්‍රියාකර මිල ගණන් ලබාදී ඇති ආයතන පවතීනම් එම ආයතන සඳහා ප්‍රසම්පාදන පිරිනැමීමට ක්‍රියා නොකල යුතුයි.
උ. මණ්ඩලයට සුදුසු යැයි හැගෙන වෙනත් කරුණු.

3. තවද මෙම මණ්ඩලය විසින් මිලගණන් පත් විවෘත කිරීම සම්බන්ධව සොයාබලා එම කාර්යයන් කඩිනමින් ඉටුකිරීමට ක්‍රියා කල යුතු අතර, මිලගණන් පත් විවෘත කිරීම සම්බන්ධ වාර්තාව 2025.04. 10 වන දිනට ප්‍රථම මෙම මූලය වෙත ඉදිරිපත් කල යුතුයි.

අයිජීජේපීකේ තිලකරත්න යූඑස්පී
බ්‍රිගේඩියර්
මධ්‍යස්ථාන සේනාවිධායක

බෙදාහැරීම:
ක්‍රියාකිරීම :
මණ්ඩල සභාපති/සාමාජික

විලි   පුලි   මානි III (පාලන)   මානි I (පාලන)   කර්නල් (පාලන)

CamScanner